රුහුණ විශ්වවිද්‍යාලය

සියලුම සිසුන්ගේ දැන ගැනීම සඳහා

නිවේදන අංක 02

**<u>2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා වෛද්‍ය පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා නාම යෝජනා පත්‍ර භා ගැනීම.</u>**

මවිසින් 2021.01.29 දිනෙන් නිකුත් කර ඇති 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා වෛද්‍ය පීඨ ශිෂ්‍ය සමි වෙනුවෙන් අංක 01 නිවේදනයෙහි දැක්වෙන තනතුරු සහ සාමාජිකත්වය සඳහා නාම යෝජනා පත්‍රය භ ගැනීම සම්බන්ධයෙනි.

02. රුහුණ විශ්වවිද්‍යාලයේ 1990 අංක 01 දරණ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිති හා පීඨ ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථ හා එම සංශෝධිත ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථාව අනුව වෛද්‍ය පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා පහත දැක්වෙන ප නාම යෝජනා භාර ගැනීමේ දිනය,වේලාව,ස්ථානය හා නිළවරණ නිළධාරියා පහත දැක්වෙන පරිදි පත්කර අ බව මෙයින් නිවේදනය කරමි.

| | |
|---|---|
| දිනය | :- 2021.02.05 |
| වේලාව | :- මධ්‍යහ්න 12.00 දක්වා |
| ස්ථානය | :- වෛද්‍ය පීඨ කාර්යාලය |
| නිළවරණ නිළධාරියා | :- පීඨාධිපති/වෛද්‍ය පීඨය |

03. නාම යෝජනා ඉදිරිපත් කළ යුත්තේ නියමිත ආකෘති පත්‍රයක වන අතර එම ආකෘති පත්‍ර අදාළ පී කාර්යාලයෙන් ලබා ගත හැක.

ශිෂ්‍ය සමිති සහ පීඨ ශිෂ්‍ය සමිති සම්බන්ධයෙන් වන 1990 අංක 01 දරණ අතුරු ව්‍යවස්ථා මාලාවෙන් න යෝජනා භාර ගැනීමට අදාළ අවශ්‍ය යයි හැඟෙන විධිවිධාන කිහිපයක් සිසුන්ගේ අවධානය සඳහා පහත දක ඇත.

05 (අ) වගන්තිය - විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටවනු ලැබ හෝ අදාළ අධ්‍යයන වර්ෂය තුළ අධ්‍යයන පාඨමාලාවක් නොහදාරයි නම් හෝ එවැනි ශිෂ්‍යයෙකු නාම යෝජනා භාරදීමට හෝ යෝජක ස්ථිරත්වයට හෝ සුදුසුකම් නොලබයි.

09 (III) වගන්තිය - අදාල අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි වී සිටින ශිෂ්‍යයින් පමණක් නාම යෝජනා පත්‍ර ඉදිරිපත් කිරීමට හා යෝජකයන්, ස්ථිරකරුවන් වශයෙන් ඉදිරිපත් වී සුදුසුකම් ලබයි. යෝජකයන් සහ ස්ථිරකරුවන් තමන් විසින් නම් කරනු ල අපේක්ෂකයන් අයත් පීඨයන්හි ලියාපදිංචි උපාධි අපේක්ෂකයන් විය යුතුය.

29/01/2021

09 (IV) වගන්තිය - **මොනයම් හෝ නිළවරණයකදී යම් සිසුවෙකු එක් තනතුරකට වැඩි සංඛ්‍යාවකට ,** එක් යෝජකයෙකුට හෝ ස්ථිරකරුවෙකුට හෝ වැඩි සඛ්‍යාවක් විසින් නාම යෝ: කරනු ලැබීමට සුදුසුකම් නොලබන්නේය

09 (V) වගන්තිය - මෙසේ ලැබෙන නාම යෝජනා පත්‍ර නාම යෝජනා බාර ගන්නට යොදන දින නාම යෝ: බාර ගැනීමට නියමිත වේලාව නිමවීමෙන් පැය 2 කට පසුව නිළවරණ නිළධාරියා වි පීඨ දැන්වීම් පුවරුවෙහි ප්‍රර්ශණය කරනු ඇත.

09 (VI) වගන්තිය - නාම යෝජනා ප්‍රදර්ශණය කිරීමෙන් පැය 2 ක් ගතවන්නට පෙරාතුව එම පීඨයේ ඡන්දදායකයෙකු විසින් නාම යෝජනා කරනු ලැබ ඇති පුද්ගලයන් කෙ: විරෝධතා ඇතොත් එම විරෝධතාවයට පිළිගත හැකි හේතු ඉදිරිපත් කර නිළවරණ නිළධාරියා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු වේ. නාම යෝජනා වලංගුතාවය තීරණය කරනු ලබන්නේ නිළවරණ නිළධාරියා විසින් වන අතර තීරණය අවසන් තීරණයද වේ.

14 (II) - එක් අධ්‍යයන වර්ෂයකට වැඩි කාලයක් සඳහා එම නිලයම් දැරීමට හෝ එම නිලය නැවත තෝරා පත් කරනු ලැබීමට හෝ කිසිදු සිසුවෙකු හිමිකම් නොලැබිය යුතුය.

5 වගන්තිය - පීඨයක ශිෂ්‍යයෙක්

(අ) පූර්ණ කාලීන උපාධි අපේක්ෂක ශිෂ්‍යයෙකු වශයෙන් නිසියාකාරව ලියාපදිංචි කොට ඇතුළත් කරගනු ලැබ නොමැත්තේ නම් හෝ නිළවරණය පැවැත්වෙන අධ්‍යයන වර්ෂය තුල අදාළ පීඨයෙහි අධ්‍ය පාඨමාලාවක් නොහදරයි නම් හෝ,

(ආ) පීඨයෙන් සහ/හෝ විශ්වවිද්‍යාලයෙන් ශිෂ්‍යභාවය අත්හිටවනු ලැබ ඇත්තේ නම් හෝ,

(ඇ) ඡන්දය දෙන අවස්ථාවේදී සිය අනන්‍යතාවය තහවුරු කිරීමට අසමත් වන්නේ නම් හෝ,

නිළවරණයකදී ඡන්දය පාවිච්චි කිරීමට හෝ ඡන්දය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් නොලබන්නේය.

1990 අංක 01 දරණ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිති හා පීඨ ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථා මාලාවේ පිටපතක් සිසුන දැන ගැනීම සඳහා වෛද්‍ය පීඨ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශණය කර ඇත.

ලේඛකාධිකාරී
රුහුණ විශ්වවිද්‍යාල
මාතර
2021.01.29

# රුහුණ විශ්වවිද්‍යාලය

## සියලුම සිසුන්ගේ දැන ගැනීම සඳහා

## නිවේදන අංක 01

**<u>2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා වෛද්‍ය පීඨ ශිෂ්‍ය සමිතිය පිහිටුවීම පිළිබඳ නිවේදනය</u>**

1990 අංක 01 දරණ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිති හා පීඨ ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථාව සහ එම සංශෝධිත ශි
සමිති අතුරු ව්‍යවස්ථාව අනුව මෙම විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨ ශිෂ්‍ය සමිතිය පිහිටුවීමට කටයුතු කරනු ලැ

පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා තෝරා ගත යුතු නිලධාරීන් සංඛ්‍යාව පහත දැක්වේ.

| | | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| සභාපති | - | 01 |
| උපසභාපති | - | 01 |
| ලේකම් | - | 01 |
| සංස්කාරක | - | 01 |
| කණිෂ්ඨ භාණ්ඩාගාරික | - | 01 |
| ශිෂ්‍ය නියෝජිත | - | 08 |

නිලවරණයේදී ඡන්දය පාවිච්චි කිරීමට හෝ ඡන්දය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබන සිසුන් පිළිබඳ විස්
නිවේදන අංක 02 හි සඳහන් වේ.

ලේඛකාධිකාරී
2021.01.29